---

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු…2,093,157 ක වවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.4,662,633 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් ලැබිය යුතු මුද්දර ගාසතු ආදායම රු…2,569,476 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම වර්ෂයට අදාල මුද්දර ගාසතු ආදායම රු…1,182,990 ක් වවද, ආදායම් හා වියදම් ගිණුමට එම ආදායම ලෙස රු.2,500,000 ක් ගිණුම් ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු…1,317,010 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,712,039 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.683,497 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,682,887 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,280 | 1,285 | 269 |
| (ii) | බදුකුලී | 2,262 | 2,176 | 273 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 313 | 571 | 209 |
| (iv) | වෙනත් ආදායම් | 17,817 | 14,436 | 38,009 |

#### 2.2.2 වරිපනම් බදු

වරිපනම් බදු බිල් කිරීම රු.303,000 ක් වූ අතර වරිපනම් හිඟය රු.343,199 ක් ලෙස බිල් කිරීම් වලින් 113% ක් පමණ විය. නියදි පරීක්ෂාවේදී වසර 1-3 අතර කාලය සිට වරිපනම් ඒකක 38 කට අදාලව රු.52,016 ක හිඟයක්ද, වසර 3-5 අතර කාලයක සිට වරිපනම් ඒකක 26 කට අදාලව රු.56,957 ක හිඟයක්ද, වසර 5 ට වැඩි කාලයක සිට වරිපනම් ඒකක 45 කට අදාලව රු.104,633 ක හිඟයක් ද ලෙස වරිපනම් ඒකක 109 කට අදාලව රු.213,606 ක හිඟයක් ද පැවතුණි.

#### 2.2.3 බදුකුලී

2012 දෙසැම්බර් 31 දිනට දේපල 02 ක් සඳහා අයවිය යුතු රු.28,500 ක හිඟ බදු කුලියක් පැවතුණි.

2.2.4 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැර් ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල අනුමත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 07 ක් වූ අතර, 2010, 2011 හා 2012 වර්ෂ වලදී ඒවාට අදාලව රු.ලක්ෂ 14 ක් අයකර පැවතියද, වාර්ෂිකව බලපත්‍ර ගාසතු අයකිරීමක් සිදුව නොතිබුණි.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු…1,660,746 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු…4,662,633 ක් විය.

2.3 <u>අවිධිමත් ගණුදෙනු</u>

සභාව විසින් 2006 අප්‍රේල් 12 දින රු.1,090,000 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කරන ලද මිනි එක්ස්කැවේටර් බැකෝ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය මිලදී ගත් දින සිට 2011 ඔක්තෝබර් මාසය දක්වාම ක්‍රියාත්මක තත්ත්වයට පත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට රු.384,597 ක මුදලක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. අදාල කාල සීමාව තුල කි.මී.3050 පමණක් ධාවනයේ යොදවා තිබුණි. මෙකී යන්ත්‍රය මිලදීගත් කාලයේ සිටම අක්‍රියව පැවතියද එහි අක්‍රමිකතා පිලිබඳව පරීක්ෂණයන් සිදුකර නොතිබුණි.

2.4 <u>වත්කම් කළමනාකරණය</u>

(අ). භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ ඉඩම් හා ගොඩනැගිලි මෝටර් රථ හා කරත්ත වල වටිනාකම රු.25,528,467 ක් වූ අතර, ලීබඩු හා සවිකිරීම් හා අතැති තොගයට අදාලව භාණ්ඩ සමීක්ෂණය කර පැවතියද, ඒවා අගය කර දක්වා නොතිබුණි.

(ආ). 2002 වර්ෂයට පෙර සිට සභාවට අයත් ගොඩනැගිල්ලක කොබෙයිගනේ පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන අතර ඉන් මාසික කුලියක් අය කර නොතිබුණි. මෙම ඉඩම සහිත ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබූ අතර, රු.ලක්ෂ 50 ක් කොබෙයිගනේ පොලිසිය විසින් සභාව වෙත ගෙවා අදාල ඉඩම් පැවරීම කරගත යුතු බව 2012 ජූලි 30 දිනැති වූ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියෙන් සභාව වෙත දැනුම් දී තිබුණි. එහෙත් මුදල් අයකර ගෙන පැවරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුව නොතිබුණි.

2.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ). සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 39 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 32 ක් ද වූයෙන් පුරප්පාඩු 7 ක් පැවති අතර, එතුල වූ ලේකම් තනතුර වැඩ බැලීමේ පදනම යටතේ පැවති අතර, අනුමත කාර්මික නිලධාරි තනතුරු 02 න් 01 ක්ද, පුස්තකාලයාධිපති තනතුරු 05 න් 04 ක්ද ආදායම් පරිපාලක තනතුර 2009 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි.

(ආ). සභාවේ මාර්ග කම්කරුවන් 8 දෙනෙකු වූ අතර ඔවුන් දිනපතා රාජකාරි වල යෙදවීම සම්බන්ධයෙන් ඉදිරි වැඩසටහනක් නොවූ අතර දිනපතා පවරනු ලබන රාජකාරි මත ඔවුන් සේවයේ යොදවා තිබුණි. ඊට අදාල කම්කරුවන් බෙදාහැරීමේ ලේඛණයක් පවත්වා නොතිබූ අතර එක් එක් පුද්ගලයාට වෙන්වූ වැඩ විස්තරද නොතිබුණි. ඒ හේතුවෙන් යම් නිශ්චිත දිනකට අදාල කම්කරුවන් සේවයේ යොදවා ඇති ස්ථාන හදුනා ගැනීම අපහසු විය.

2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ). සභාව විසින් මංමාවත් අළුත්වැඩියා කිරීම හා නඩත්තු වැය විෂයය යටතේ රු.650,000 ක පිරිවැය මත මාර්ග 9 ක් නඩත්තු කිරීමට නියමිතව තිබුණි. එහෙත් ප්‍රතිසංස්කරණය කළයුතු යැයි යෝජිත මාර්ග 9 න් එක් මාර්ගයක් පමණක් නිමකර තිබූ අතර, ඊට පරිබාහිරව මෙකී ප්‍රතිපාදන මත විවිධ අවස්ථා වලදී මන්ත්‍රී යෝජනා මත විවිධ කර්මාන්ත ඉටුකර තිබුණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…454,882 ක් ව තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය